# “තොරතුරු තාක්ෂණයෙන් පණගැන්වූ වයඹ පෞද්ගලික මගී ප්‍රවාහන සේවාව”

## ව්‍යාපෘති වාර්තාව - 2015

මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය
(වයඹ පළාත)

1. මගී ජනතාව සඳහා කලට වේලාවට ගෞරවනීය සුරක්ෂිත ගමනාන්තයක් ලගාකර දීම

## 1. ව්‍යාපෘතියට අදාළ විස්තර:-

**01.** ප්‍රධාන තොරතුරු පද්ධතිය (ධාවන අංශය)

- වයඹ පළාතට අදාල මාර්ග
- බලපත්‍ර විස්තර
- මාර්ගවල ධාවනය කරනු ලබන බස්රථවල විස්තර
- ධාවන කාලසටහන්
- බස්හිමියන් පිළිබඳ විස්තර
- මාසික ධාවන සටහන්පත්‍ර, විශේෂ චාරිකා , අමතර ගමන්වාර , පිවිසුම් පත්‍ර
- රියදුරු කොන්දොස්තරවරුන් පිළිබඳ විස්තර
- සේවා ගාස්තු පිළිබඳ විස්තර

**02.** මුල්‍ය ගිණුම් කළමණාකරන තොරතුරු

- පොදු ලෙජරය
- ස්ථාවර වත්කම්
- වවුචර් මගින් ගෙවීම
- මුදල් ලැබීම් හා එකතුකිරීම්
- මුල්‍ය පාලනය
- අයවැය
- පිරිවැය
- අවසන් ගිණුම් සැකසීම
- මුදල් ප්‍රවාහය

**03.** මානව සම්පත් කළමණාකරණය

- බඳවා ගැනීම
- පුහුණුව ලබා දීම
- වැටුප් සංයුක්ත දීමනා,අතිකාල,
- අර්ථසාධක, සුභ සාධනය, සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල, පාරිතෝෂික
- කාර්ය චක්‍ර යෙදවීම
- විශ්‍රාම ගැන්වීම
- උසස්වීම් ලබාදීම
- මාරු කිරීම
- ඉලක්ක සපුරාලීම

- වේලාසටහන්කරුවන් පාලනය

**04.** මහජන සම්බන්ධතාව

- වෙබ්පිටු (Call center)
- පැමිණිලි අංශය ( Document Management)
- බස්හිමියන්ට සිය බලපත්‍ර විස්තර ලබාදීම

**05.** ලිපිගොණු කළමණාකරණය

- වෙනත් ආයතන වලින් ලැබෙන ලිපි
- වෙනත් ආයතන වෙත යොමුකෙරෙන ලිපි
- ලිපිවලට අදාලව ගත් ක්‍රියාමාර්ග
- ආයතනය ඇතුලත යොමුකෙරෙන ලිපි

**06.** ගබඩා කළමණාකරණය

- වාහන
- ඉන්ධන
- තොග පාලනය

**07.** රියදුරු අභ්‍යාස විද්‍යාල කළමණාකරණය

- බඳවා ගැනීම
- පුහුණුව ලබාදීම
- ආදායම් වියදම
- බලපත්‍ර ලබාදීම

**08.** තොරතුරු පුවරුව

**09.** කැමරා පද්ධතිය

**10. GPS** තාක්ෂණය

## 2. සෘජු හා වක්‍ර ප්‍රතිලාභීන්:-

1.මගී ජනතාව.

2.රාජ්‍ය නිළධාරීන් (මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය හා අමාත්‍යාංශය)

3.බලපත්‍රලාභීන්.

4.රියදුරු මහතුන්.

5. කොන්දොස්තර මහතුන්.

6. දේශපාලන අධිකාරිය.

## 3. ශදුඅත (SWOT) විශ්ලේෂණය. :-

### I. ශක්තීන්

a. කාර්යක්ෂම නිළධාරී මණ්ඩලයක් සිටීම.

b. දේශපාලන අධිකාරියේ සහයෝගය ලබාගැනීමට හැකිවීම.

### II. දුර්වලතා

a. අමාත්‍යාංශය හා අධිකාරිය තුළ අවශ්‍යය මෘදුකාංග නිර්මාණය සඳහා තාක්ෂණ දැනුමින් පිරිපුන් පුද්ගලයින් නොමැතිකම.

b. රියදුරන්ගේ හා කොන්දොස්තරවරුන්ගේ උනන්දුවක් නොමැතිකම හා අඩු අධ්‍යාපන මට්ටම.

c. අන්තර්ජාල ප්‍රවේශය සඳහා ඔවුන්ට පහසුකම් අඩුකම.

d. මෘදුකාංග සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුවීම

### III. අවස්ථා

a. වෙළඳපොළ මෘදුකාංග සැපයුම් කරුවන් සිටීම.

### IV. තර්ජන

a. පුළුල් වශයෙන් පරිගණක අධ්‍යාපනය ලබාදීමට සිදුවීම.

b. දූෂණ හා වංචා හෙලිවන නිසා නිවැරදි තොරතුරු ලබා නොදීම.

c. මෙමඟින් අත්වන වාසි පිලිබඳ නොදැනුවත්කම.

## 9. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම.

| අනු අංකය | ක්‍රියාකාරකම | කාල වකවානුව | වගකීම |
|---|---|---|---|
| 01. | අදාල ව්‍යාපෘති වාර්තාව සැකසීම. | සති 02 යි | මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය |

| | | | |
|---|---|---|---|
| 02. | අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම හා ප්‍රතිපාදන ලබාගැනීම. | මාස 01 යි | මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය |
| 03. | මෘදුකාංග ආයතනයක් සොයාගැනීම හා අවශ්‍ය තාක්ෂණික මෙවලම් ලබාගැනීම. | මාස 01 යි | මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය |
| 04. | මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීම. | මාස 02 යි. | මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය |
| 05. | අවශ්‍ය තොරතුරු ලබා ගැනීම. | මාස 02 යි. | මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය |
| 06. | ලබාගත් තොරතුරු මෘදුකාංග පද්ධතියට ඇතුලත් කිරීම | මාස 02 යි. | මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය |
| 07. | මෘදුකාංග භාවිතය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම. | මාස 01 යි | මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය |
| 08. | තොරතුරු ලබාගැනීමට හා යාවත්කාලීන කිරීම සඳහා අවස්ථාව ලබාදීම. | දිගුකාලීනව | මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය |

## 10. පිරිවැය හා මූල්‍ය විශ්ලේෂණය.

| ක්‍රියාකාරකම | මුදල රු. මිලියන |
|---|---|
| 1. ප්‍රවාහනය සම්බන්ධ සියළු කටයුතු පරිගණක තාක්ෂණයෙන් ඉටුකර ගැනීමට පහසුකම් සැළසීම | 5.59 |
| 2. GPS තාක්ෂණය හඳුන්වා දීම හා එමගින් ප්‍රවාහන කටයුතු අධීක්ෂණය කිරීම | |

## 11. අපේක්ෂිත නිමැයුම හා ප්‍රතිලාභ:-

a. ගැටළු අවම ප්‍රවාහන ක්ෂෙත්‍රයක් බිහි වීම.

b. ජනතාවට කාර්යක්ෂම සේවාවක් ලැබීම.

c. විනය ගරුක රියදුරුන් හා කොන්දොස්තර කාර්ය මණ්ඩලයක් බිහිවීම.

d. බලපත්‍ර නිකුතුව,යාවත්කාලීන කිරීම වැනි කාර්යන් කාර්යක්ෂම වීම.

e. වැරදි වංචා හා දූෂණ අවම වීම.

f. ප්‍රවාහන ක්ෂේත්‍රයට අදාල තොරතුරු හුවමාරුව වේගවත් වීම.

g. රාජ්‍ය අංශයේ කාර්යක්ෂමතාව හා ඵලදායීතාව සීඝ්‍රයෙන් වර්ධනය වීම.

h. වේගවත්ව නිවැරදි තීරණ ගැනීමට අවශ්‍ය පරිසරයක් බිහිවීම.

## 12.නඩත්තුව හා තිරසාරභාවය:-

අධිකාරිය තුළ මෙම පද්ධතිය නඩත්තුව සඳහා නිළධාරීන් කිහිප දෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක් ස්ථාපිත කරනු ලබන අතර ඔවුන්ට එහි වගකීමද පවරනු ලැබේ.එමෙන්ම මෘදුකාංග ආයතනයෙන් නිරන්තර උපදෙස් හා සේවා පහසුකම් ලබාගැනීම සඳහා ගිවිසුමකට එලඹෙන අතර මෘදුකාංගයේ පැමිනෙන දෝෂ, දුර්වලතා හා අනෙකුත් සේවා සැපයීමට අදාල වගකීම මෘදුකාංග සමාගම වෙත පවරනු ලැබේ.

මෙහිදී මගී ජනතාවට හා බස්රථ සේවකයින්ටද වගකීමක් පැවරෙන අතර කිසියම් සීමාවකට යටත්ව දත්ත හා තොරතුරු ඇතුලත් කිරීමටත් අවස්ථාව සැලසේ. එමෙන්ම තොරතුරු යාවත්කාලීන කිරීම නිසියාකාරව සිදුවන්නේද යන්න නිරන්තර අධිකාරියේ අවධානයට යොමු වේ.

## 13.මෙහෙය වීම හා ඇගයීම් ක්‍රමවේදය:-

මෙම ව්‍යාපෘතියේ මෙහෙයුම් කාර්ය නිවැරදිව සිදුවන්නේද යන්න අධ්‍යයනය කිරීම සම්පූර්ණයෙන්ම අධිකාරියට පැවරෙන අතර මාසික ප්‍රගති සමාලෝචන රැස්වීමේදී හා අමාත්‍යාංශයේ විමර්ශණ කණ්ඩායම් නිළධාරීන්ගේ සහායෙන් ව්‍යාපෘතියේ සමස්ථ ප්‍රගතිය පිළිබඳව නිරන්තර ඇගයීම් කටයුතු සිදුකරණු ලැබේ.

## 14.වෙනත් අදාළ කරුණු -:-